# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
☏ +94112785141-50 | 🖷 +94112785818
✉ info@moe.gov.lk | 🌐 www.moe.gov.lk


මගේ අංකය / எனது இல. / My Ref. } ED/02/29/02/02/07(II) — ඔබේ අංකය / உமது இல. / Your Ref. } — දිනය / திகதி / Date } 2022.01.08

චක්‍රලේඛ අංක : 2022/01

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

<u>ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 02 ක්‍රියාත්මක කිරීම.</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.10.23 දිනැති අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය 2021.11.24 දිනැති අංක 2255/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් දෙවන වරට සංශෝධනය කරන ලදී.

02. ඒ අනුව 2021.11.24 දිනැති අංක 2255/14 දරන ගැසට් නිවේදනයේ පිටපතක් මේ සමඟ යොමු කරන අතර එහි සඳහන් විධිවිධාන නොපමාව ක්‍රියාත්මක කරන ලෙස අවධාරණය කරමි.

මහාචාර්ය කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

| | | | |
|---|---|---|---|
| (1) | අල්කම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | කරු. දැ.ගැ.ස. |
| (2) | සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් | - | කරු. දැ.ගැ.ස. |
| (3) | සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් | - | කරු. දැ.ගැ.ස. |

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2255/14 – 2021 නොවැම්බර් 24 වැනි බදාදා – 2021.11.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 02**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් මස 23 දිනැති අංක 1885/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2021 නොවැම්බර් මස 22 වැනි දින.

I කොටස

සංශෝධන අංක 01 - 2019 අප්‍රේල් මස 22 වැනි දින හා අංක 2120/2 අති විශෙෂ ගැසට් පත්‍රය

II කොටස

13.14
"පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව" යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් පිරිනමනු ලබන අධ්‍යාපන විෂයය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.

හෝ

ඉහත සඳහන් විෂයානුබද්ධ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා:

I. කොළඹ විශ්වවිද්‍යාලයේ "නාට්‍ය හා රංග කලාව" පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව
II. කොළඹ විශ්වවිද්‍යාලයේ " Teaching of English as a Second Language " පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව
III. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ " Special Needs Education " පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව
IV. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (Postgraduate Institute of Science) මගින් පිරිනැමෙන විද්‍යා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව (PGDSE),

හෝ

ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය යන ආයතනවලින් එක් නියෝජිතයකු බැගින් ඇතුළත් ත්‍රිපුද්ගල ශාස්ත්‍රීය කමිටුවක් (Academic Board) මගින් නිර්දේශ කරනු ලබන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හා සම තත්ත්වයේ ලා සැලකෙන විෂයානුබද්ධ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව වේ.

13.15

"අධ්‍යාපන පශ්චාත් උපාධියක්" යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් පිරිනමනු ලබන අධ්‍යාපන විෂය පිළිබඳ පශ්චාත් උපාධිය,

හෝ

**ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය යන ආයතනවලින් එක් නියෝජිතයකු බැගින් ඇතුළත් ත්‍රිපුද්ගල ශාස්ත්‍රීය කමිටුවක් (Academic Board) මගින් නිර්දේශ කරනු ලබන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන, අධ්‍යාපන පශ්චාත් උපාධිය හා සම තත්ත්වයේ ලා සැලකෙන විෂයානුබද්ධ පශ්චාත් උපාධිය වේ.**

12-101

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.